# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: CGO/ASM/Policy/Cir/ (VOL II)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022.01. 25

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක : 04/2022**

සියලුම : අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
රාජ්‍ය බැංකු හා රාජ්‍ය සමාගම් සභාපතිවරුන්

**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය**

**රජයේ දේපළ විනාශ වීමට ඉඩහැරීම සහ රජයට ලැබිය යුතු ආදායම අහිමිවීම වැළැක්වීමට රජයේ වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ අවශ්‍ය පරිදි නොපමාව අපහරණය කිරීම**

අමාත්‍ය මණ්ඩලය විසින් නියෝග කරන ලද පරිදි 2020 ඔක්තෝම්බර් 02 නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 05/2020 මගින් උපදෙස් ලබාදී තිබියදීත් ධාවන තත්ත්වයේ නොපැවති වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමේ හෝ අපහරණය කිරීමේ ප්‍රගතිය සතුටුදායක නොවන බව සැලකිල්ලට ගෙන, මෙම වත්කම් විනාශ වීමට ඉඩහැරීම සහ රජයේ ආදායම අහිමිවීම වැළැක්වීම උදෙසා, වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ අවශ්‍ය පරිදි නොපමාව වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය, 2022 ජනවාරි 10 දින පැවති රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලය විසින් අවධාරණය කර ඇත.

02. ඒ අනුව, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුලු සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විසින් පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය කටයුතු කලයුතු වේ:

**අ). ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන අපහරණය කිරීම**

2020 අගෝස්තු 31 දින වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කරන ලද ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන අපහරණය කිරීම මේ වන තෙක් සිදු කර නොමැති ආයතනවල ප්‍රධානීන් විසින්, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 05/2020 හි 02 (අ) මගින් ලබාදී ඇති උපදෙස් පරිදි, එවැනි වාහන අපහරණය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට වහාම කටයුතු කල යුතු වේ.

**ආ). ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී වන වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම**

2020 අගෝස්තු 31 දින වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කරන ලද ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී වන වාහන අලුත්වැඩියා කිරීම මේ වන තෙක් සිදු කර නොමැති ආයතනවල ප්‍රධානීන් විසින්, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 05/2020 හි 02 (ආ) මඟින් ලබාදී ඇති උපදෙස් පරිදි, එවැනි වාහන අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම කඩිනමින් සිදුකල යුතු වේ.

**ඇ). රජයේ දේපළ විනාශ වීමට ඉඩහැරීම සහ රජයේ ආදායම අහිමිවීම වැළැක්වීම උදෙසා, වාහන නිසි පරිදි භාවිතා කිරීම සහ අවශ්‍ය පරිදි නොපමාව අපහරණය කිරීම**

අවශ්‍ය උපදෙස් චක්‍රලේඛ මඟින් ලබාදී තිබියදීත්, අදාල රාජ්‍ය ආයතන විසින් වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කිරීම හේතුවෙන්, අලුත්වැඩියා කල යුතු හෝ අපහරණය කල යුතු වාහන විශාල ප්‍රමාණයක් රජයේ ආයතන සතුව තවදුරටත් පවතින බව වාර්තා වේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇති පරිදි, රජයේ දේපළ විනාශ වීමට ඉඩහැරීම සහ රජයේ ආදායම අහිමිවීම වැළැක්වීම උදෙසා, නිසි පරිදි නඩත්තු කිරීම හා නොසැලකිලිමත් භාවිතයෙන් තොරව වාහන නිසි පරිදි භාවිතා කිරීම මෙන්ම අදාල චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් අවශ්‍ය පරිදි නොපමාව වාහන අපහරණය කිරීම, සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ගේ අනිවාර්ය කාර්යයක් වන බව, මෙයින් අවධාරණය කරමි.

03. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා, ඉහත 02හි (අ) හා (ආ) හි සඳහන් උපදෙස් පරිදි අපහරණය කල හෝ අලුත්වැඩියා කල වාහන පිළිබඳ තොරතුරු මේ සමඟ ඇති ඇමුණුමෙහි සඳහන් පරිදි, 2022 අප්‍රේල් 30 දිනට පෙර, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කලයුතු වේ.

**එස්.ආර්. ආටිගල**

**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:
1 ජනාධිපති ලේකම්
2 අග්‍රාමාත්‍ය ලේකම්
3 අමාත්‍ය මණ්ඩල ලේකම්
4 අයවැය අධ්‍යක්ෂ ජනරාල්
5 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්
6 විගණකාධිපති